සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**10 ශ්‍රේණිය** | **දෙවන වාර පරීක්ෂණය - 2024** | **61 S I**

**භූගෝල විද්‍යාව** | **කාලය පැය තුනයි**

## I කොටස

**සැලකිය යුතුයි.**
**මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත වේ.**
**එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**

- ප්‍රශ්න අංක 01 සිට 05 තෙක් දී ඇති ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

01. පෘථිවිය මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් .................................. පමණ වේ.
( 610 / 510 / 620 )

02. වායුගෝලය ප්‍රධාන ස්තරවලට බෙදා ඇත්තේ උන්නතාංශය සමග .......................................... වෙනස්කම් පදනම් කරගෙනයි. (වායුවේ / උෂ්ණත්ව / පීඩන)

03. ලෝකයේ උසම ස්ථානයක පිහිටි විල .......................................... විල වේ.
(ටිටිකාකා / සුපීරියර් / වික්ටෝරියා)

04. තුන්ද්‍රා දේශගුණය ලෝකයේ .......................................... දේශගුණ කලාපය තුළ දක්නට ලැබෙන විශේෂිත දේශගුණ වර්ගයකි. ( නිවර්තන / සෞම්‍ය / ශීත)

05. සුළු අපනයන බෝග පර්යේෂණ ආයතනය පිහිටා ඇත්තේ ...................................... දිස්ත්‍රික්කයේ ය.
(මාතලේ / මහනුවර / ගාල්ල)

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.

06. ප්‍රාවරණය තුළ ක්‍රියාත්මක වන ........................................... වල බලපෑමෙන් තැටි චලනය වේ.

07. ලෝකයේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනය බහුල ලෙස ව්‍යාප්ත වී පවතින්නේ .......................................... කලාපීය ප්‍රදේශවලය.

08. පෘථිවි ගෝලය මත නිරන්තර ක්‍රියාකාරිත්වයෙන් යුතු ශාක හා සත්ත්ව විශේෂ ඇතුළත් සමස්ත ජීවී පරිසරය .......................................... ලෙස හඳුන්වයි.

09. වර්ෂණය මගින් පෘථිවිය මතට ලැබෙන ජලයෙන් කොටසක් භූමිය මතුපිට ගලායාම ................................ ලෙස හැඳින් වේ.

10. ලෝකයේ ගැඹුරු සාගරික ආගාධ වැඩි ප්‍රමාණයක් දැකිය හැකි වන්නේ ......................................... සාගරයේ ය.

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් 'නි' යන්න වටාද වැරදි නම් 'වැ' යන්න වටාද රවුමක් අඳින්න.

11. කෘෂිකාර්මික ක්‍රමයක් වුවද කාර්මික ලක්ෂණ පෙන්නුම් කිරීම වතු කෘෂි කර්මයේ විශේෂ ලක්ෂණයකි. (නි / වැ)

12. කෙටි කාලයක් තුළ පවත්නා වායුගෝලීය සාමාන්‍ය තත්ත්වය දේශගුණය නම් වේ. (නි / වැ )

13. ග්‍රාස් කාෆ්, බිග්හෙඩ් කාෆ්, කැට්ලා වැනි මසුන් කරදිය ධීවර කර්මාන්තයේ දී බෝ කරනු ලබයි. ( නි / වැ )

14. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගෝනවල මාකඳුර කාබනික පොහොර මධ්‍යස්ථානය පිහිටුවා ඇත. ( නි / වැ )

15. ශ්‍රම බලකායේ 31% ක් කෘෂි අංශයේ රැකියාවල නියුක්ත වේ. ( නි / වැ)

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති ප්‍රශ්න වල 'අ' සහ 'ආ' යනුවෙන් තීර දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙලට 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියා දක්වන්න.

16. 'අ' මුහුද — 'ආ' පිහිටි සාගරය

i. කැරිබියන් මුහුද — A-අත්ලන්තික් සාගරය
ii. කහ මුහුද — B-ආක්ටික් සාගරය
iii. බෝල්ටික් මුහුද — C-පැසිපික් සාගරය
D-ඉන්දියන් සාගරය

1. ACD 2. ACB 3. CBA 4. BCA

(....................)

17. 'අ' මහද්වීපය — 'ආ' දූපත

i. ආසියා — A-බැෆින්
ii. ඔස්ට්‍රේලියා — B-පිලිපීනය
iii. උතුරු ඇමරිකා — C-ෆෝක්ලන්ඩ්
D-තස්මේනියාව

1. BAD 2. ACD 3. BDA 4. CBD

(....................)

18. 'අ' විල — 'ආ' මහද්වීපය

i. චැඩ් — A-උතුරු ඇමරිකාව
ii. අයර් — B-ආසියාව
iii. බයිකල් — C-අප්‍රිකාව
D-ඔස්ට්‍රේලියාව

1. DBA 2. CDB 3. CDA 4. ACD

(....................)

19. 'අ' යකඩ නිෂ්පාදිත මධ්‍යස්ථානය — 'ආ' පිහිටි රට

i. පීට්ස්බර්ග් කලාපය — A-රුසියාව
ii. යූරල් කලාපය — B-ඉන්දියාව
iii. ලැන්කැෂියර් ප්‍රදේශය — C-එක්සත් රාජධානිය
D-ඇමරිකා එක්සත් ජනපදය

1. DAC 2. DCB 3. ACD 4. CAD

(....................)

20. 'අ' භෝගය — 'ආ' අපනයන ගම්මාන පිහිටි ප්‍රදේශය


i. මිරිස් — A-කටුගම්පල
ii. කජු — B-දඹදෙණිය
iii. බුලත් — C-රාජාංගනය
D-අගුණකොළපැලැස්ස

1. CBD 2. DAB 3. ACB 4. CBA

(....................)

• ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී පහත දැක්වෙන ප්‍රස්තාරය ප්‍රයෝජනයට ගන්න.

ශ්‍රී ලංකාවේ වී වගා කරන ලද භූමි ප්‍රමාණය හා නිෂ්පාදන ප්‍රමාණය 2008-2012




මූලාශ්‍රය ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2013

21. වී වගා කරන ලද බිම් ප්‍රමාණය වැඩි කුමන වර්ෂයේ දී ද? ..........................................................

22. වැඩිම වී නිෂ්පාදනයක් වාර්තාවන වර්ෂය කුමක් ද? ..................................................

23. වී වගා කරන ලද භූමි ප්‍රමාණය අඩු කුමන වර්ෂයේ දී ද? ..........................................................

24. ප්‍රමාණයෙන් අඩුම වී නිෂ්පාදනක් වාර්තාවන වර්ෂය කුමක් ද? ..................................................

25. ඉහත ප්‍රස්තාර වර්ගය හඳුන්වන නම ලියන්න. ..........................................................

• ප්‍රශ්න අංක 26 සිට 36 දක්වා ප්‍රශ්නවල එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

26. හවායි දූපත් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
1. අත්ලාන්තික් සාගරයේ පිහිටි දූපතකි.
2. අප්‍රිකා මහද්වීප තටකය තුළ පිහිටා ඇත.
3. යමහල් ක්‍රියාකාරීත්වය නිසා නිර්මාණය වී ඇත.
4. ආසියා මහද්වීපයට අයත් දූපතකි. (.........)

27. වායුගෝලයේ ලක්ෂණ කිහිපයක් පහත දැක්වෙන අතර ඉන් කියැවෙන්නේ කුමන වායුගෝලීය ස්ථරය ද?
- උන්නතාංශය සමඟ උෂ්ණත්වය අඩුවේ.
- ජල වාෂ්ප, වළාකුළු දූවිල අංශු නොමැත.
- මුහුදු මට්ටමේ සිට 80 km පමණ උසට විහිදෙයි.
- විද්‍යුත් ක්‍රියාවලිය බහුලව සිදුවේ.

1. පරිවර්තීගෝලය 2. තාපගෝලය
3. අපරවර්තීගෝලය 4. මෙසෝගෝලය (.........)

28. සම්පූර්ණයෙන්ම ගොඩබිමෙන් වට වූ මුහුදකට නිදසුනක් වන්නේ කුමක් ද?
1. ඒරල් මුහුද 2. රතු මුහුද 3. චීන මුහුද 4. ජපන් මුහුද (.........)

29. ඔස්ට්‍රේලියා මහාද්වීප තටකය තුළ පිහිටි දූපත් දෙකකට නිදසුන් දැක්වෙන පිළිතුර වන්නේ,
1. තායිවානය, පිලිපීන දූපත් 2. පැපුවා නිව්ගිනියාව, තස්මේනියාව
3. බ්‍රිතාන්‍ය දූපත්, අයිස්ලන්තය 4. මැඩගස්කරය, සිෂෙල්ස් දූපත් (.........)

30. ශ්‍රී ලංකාවේ අඩුම බිම් ප්‍රමාණයක් වී වගාවට යොදා ගනු ලබන දිස්ත්‍රික්කය කුමක් ද?
1. බදුල්ල 2. අනුරාධපුරය 3. නුවරඑළිය 4. අම්පාර (.........)

31. A- 1900 mm ට වැඩි වර්ෂාපතනය.
B- මද බෑවුම් පතිත 300 m වඩා අඩු උස්බිම් ප්‍රදේශ.
C- 150C$^0$ - 25C$^0$ දක්වා සාමාන්‍ය උෂ්ණත්වය.
D - කබොක් මිශ්‍ර රතු පස.
ඉහත දැක්වෙන සාධක අතුරෙන් රබර් වගාව සඳහා වඩාත් යෝග්‍ය සාධක දෙකක් වන්නේ,
1. A හා C ය. 2. B හා D ය. 3. B හා C ය. 4. C හා D ය. (.........)

32. ශිලා ගෝලයේ භූ තැටි අතරින් සුළු තැටියක් නොවන්නේ, පහත ඒවායින් කුමක් ද?
1. පිලිපීන තැටිය 2. අරාබියානු තැටිය
3. නස්කා තැටිය 4. යුරේෂියානු තැටිය (.........)

33. A- උෂ්ණත්වය අධිකම කලාපයයි
B- ඍතු භේදය දැනගත හැකියි.
C- වසරපුරා පැතිරුණු වර්ෂාපතනයක් ඇත.
D - තුහින හා හිම පතනය සිදුවේ.
ඉහත දැක්වෙන ලක්ෂණ අතරින් නිවර්තන දේශගුණයේ ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. A හා C ය. 2. A හා B ය. 3. B හා D ය. 4. B හා C ය. (.........)

34. උත්ස්වේදන ක්‍රියාවලිය නිසා වායුගෝලයට එකතු වන්නේ,
1. සාගරවල ඇති ජලයයි. 2. ගංගා විල්වල ඇති ජලයයි.
3. ශාකපත්‍රවල අඩංගු ජලයයි. 4. භූ තල ඇති ජලයයි. (.........)

35. 1:50000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන භෞතික ලක්ෂණ පමණක් අඩංගු වරණය තෝරන්න.
1. ගංගාව, කඳුවැටිය, වනාන්තර 2. කඳුවැටිය, වැව, වේල්ල
3. ගංගාව, නිම්නය, වාරිඇළ 4. උසාවිය, පොලීසිය, පාසල (.........)

36. පහත දැක්වෙන සිතියම් අතරින් තේමා සිතියමක් නොවන්නේ කුමක් ද?
1. ශ්‍රී ලංකාවේ මාර්ග සිතියම. 2. ආසියාවේ ජන ඝනත්වය.
3. අප්‍රිකාවේ භූ විෂමතාවය. 4. භූ ලක්ෂණ සිතියම. (.........)

- පහත A,B,C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 37 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A- 1. ආහාර නිෂ්පාදනය
2. ජනගහන වර්ධනය

B-1. ගෝලීය උණුසුම
2. කාර්මීකරණය

C- 1. සෞඛ්‍ය පහසුකම්
2. මරණ අනුපාතය

D-1. වනගහනය
2. කෘෂිකර්මය

37. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ අඩුවීමට හේතුවක් වන බව දැක්වෙන මාතෘකා යුගලය කුමක් ද?
1. A 2. B 3. C 4. D

38. පළමුවැන්නේ වැඩිවීමට දෙවැන්න හේතුවක් වන බව දක්වෙන මාතෘකා යුගලය වන්නේ,
1. A 2. B 3. C 4. D

39. දෙවැන්නේ වැඩිවීමට පළමුවැන්නේ ද වැඩිවීම හේතුවක් වන මාතෘකා යුගලය කුමක් ද?
1. A 2. B 3. C 4. D

40. පළමුවැන්නේ අඩුවීමට දෙවැන්න හේතුවක් වන බව දක්වෙන මාතෘකා යුගලය කුමක් ද?
1. A 2. B 3. C 4. D

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 61 S II


## භූගෝල විද්‍යාව

**සැලකිය යුතුයි.**

- **මෙම ප්‍රශ්න පත්‍රය I, II වශයෙන් කොටස් දෙකකි.**
- **I කොටසෙහි ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ) (ආ) සහ (ඉ) යන කොටස් තුනටම පිළිතුරු සැපයයි යුතුය.**
- **II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය. පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව 05කි.**

### I කොටස

**(අ) පහත ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා 1:50.000 භූ ලක්ෂණ සිතියමේ ආකෘතිය ප්‍රයෝජනයට ගන්න.**




i. වට තීරුවේ ඉහළ කොටසෙහි සඳහන්වන තොරතුරු දෙකක් ලියන්න. (ල. 01)

ii. වට තීරුවේ පහළ කොටසෙහි සූචකය සකස් කර ඇත්තේ ප්‍රධාන ශීර්ෂ අටක් යටතේ ය. එයින් දෙකක් නම් කරන්න. (ල. 01)

iii. C තීරුව නම් කර එහි සඳහන්වන තොරතුරක් ලියන්න. (ල. 01)

iv. 1:50000 භූ ලක්ෂණ සිතියමක පිහිටීම ප්‍රකාශ කළ හැකි ආකාර දෙකක් ලියන්න. (ල. 01)

v. 1:50000 භූ ලක්ෂණ සිතියමේ රේඛීය පරිමාණය ඇඳ දක්වන්න. (ල. 02)

vi. පහත දැක්වෙන සංස්කෘතික ලක්ෂණ දෙක හැඳිනගෙන නම් කරන්න. (ල. 02)

a) 

b) 

vii. භූමියේ 4 $km^2$ කුඹුරු යායක් 1:50000 භූ ලක්ෂණ සිතියමේ නිරූපණය කරන ආකාරය ඇඳ දක්වන්න. (ල. 02)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අංක i. සිට v තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබද ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංක ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න. (ල. 05)

i. ඇට්ලස් කඳු ABC
ii. බහමාස් දූපත් DEF
iii. යෙනිසි ගඟ KLM
iv. බොෆෝට් මුහුද STU
v. ආර්ජන්ටිනාව XYZ

(୨) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. අංක i සිට v තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියේ ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබද ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංක ඉදිරියේ ඇති කොටුව තුළ ලියන්න.


i. පර්ල් මුතුපරය A,B,C (ල. 05)
ii. ඉගිනියාගල D,E,F
iii. මන්නාරම් බොක්ක J,K,L
iv. ලුණුවිල P,Q,R
v. ගාල්ල X, Y,Z

(02)i. ජෛව ගෝලය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල.02)

ii. a. ජෛව ගෝලයේ සමතුලිතබව බිඳ වැටීමට හේතු වී ඇති මානව ක්‍රියාකාරකමක් ලියන්න.
b. ජෛව ගෝලයේ ක්‍රියාකාරීත්වයට බලපාන ප්‍රධාන සාධක දෙක ලියන්න. (ල.03)

iii. a.පෘථිවි ගෝලයේ මතුපිට ජලය ව්‍යාප්ත වී ඇති ආකාර 2 ක් ලියන්න.
b.ජලයේ ගුණාත්මක බව අඩුවීම නිසා අනාගතයේ ඇති විය හැකි ජල හිඟය මඟහරවා ගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(03)i.පෘථිවි ව්‍යුහය දැක්වෙන පහත රූප සටහනේ A හා B අක්ෂර වලින් දැක්වෙන ස්තර දෙක පිළිවෙලින් නම් කරන්න. (ල. 02)




ii. a). රූප සටහනේ A හා B ස්ථර වෙන් කරන සීමාව හඳුන්වන නම ලියන්න.
b). A ස්ථරය සමන්විත වන ප්‍රධාන කොටස් දෙක ලියන්න. (ල. 03)


iii. a). C අක්ෂරයෙන් දැක්වෙන ස්ථරයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න.
b). ශිලා ගෝලයේ ඇති සම්පත් මිනිසා විසින් ප්‍රයෝජනයට ගැනීමේ දී ශිලාගෝලයට ඇතිවන බලපෑම් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

(04) i. a).උතුරු ඇමරිකාවේ පිහිටි ප්‍රධාන කඳු වැටියක් හා
b).ආසියාවේ පිහිටි ප්‍රධාන තැනිතලාවක් පිළිවෙලින් නම් කරන්න. (ල. 02)

ii. පහත නිර්වචනය කරන භූ විෂමතා ලක්ෂණ හඳුන්වන නම ලියන්න. (ල. 02)
a). සම මුදුණකින් හෝ ආසන්න සමතාවෙන් යුත් මුදුන් සහිත කඳුවලින් වට වූ උස් සම භූමිය
b). ජලයෙන් වට වූ විවිධ හැඩයෙන් යුතු කුඩා ගොඩබිම්
c).මුදුන් කිහිපයක් සහිත විවිධ බෑවුම් වලින් සහ ඉහළ උන්නතාංශයකින් යුක්ත එක දිගට විහිදෙන භූ රූප

iii. a). තැනිතලා භූමි ප්‍රදේශ මිනිස් වාසය සඳහා බහුලව යොදා ගැනීමට බලපා ඇති හේතු 2 ක් ලියන්න.
b). ගංගා හා විල් මානුෂ ක්‍රියාකාරකම් වලදී වැදගත් වන ආකාරය නිදසුන් 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 05)

• ප්‍රශ්න අංක (05) (06) සඳහා පිළිතුරු සැපයීමේ දී පහත දැක්වෙන සිතියම උපයෝගී කර ගන්න.




(05) I. කර්මාන්ත ස්ථානගතවීමට බලපාන සාධක 2ක් ලියන්න. (ල.02)

II. a) යකඩ හා වානේ කර්මාන්තයට ප්‍රසිද්ධ නැගෙනහිර ආසියාතික රටක් සිතියමේ A අක්ෂරයෙන් දැක්වේ. එය නම් කරන්න.

b) ඉහත ඔබ නම් කළ රටෙහි යකඩ හා වානේ කර්මාන්තය ස්ථානගතවීමට බලපෑ ඇති සාධක 2 ක් ලියන්න. (ල.03)

III. a) යකඩ හා වානේ කර්මාන්තයේ ලක්ෂණ 2ක් ලියන්න.

b) යකඩ හා වානේ කර්මාන්තයේ මෑත කාලීන ප්‍රවණතා දෙකක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

(06) i. සිතියමේ C හා D වලින් දැක්වෙන ආසියාවෙන් බැහැරව වී වගා කරන ප්‍රදේශ දෙක පිළිවෙලින් ලියන්න (ල.02)

ii. a). සිතියමේ B අක්ෂරයෙන් දැක්වෙන්නේ ව්‍යාපාරික ධාන්‍ය වගාව සිදු කරන රටකි. එය නම් කරන්න.

b).වී වගාව සහ තිරිඟු වගාව සඳහා යෝග්‍ය පස් වර්ග මොනවාදැයි පිළිවෙලින් ලියන්න. (ල.03)

iii. a). ලෝකයේ වී වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.

b).ලෝක වෙළඳපලේ තිරිඟු ප්‍රධාන බෝගයක් ලෙස වැදගත්වීමට බලපා ඇති හේතු තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(07) i. ශ්‍රී ලංකාවේ (a) උඩරට සහ (b) මැදරට තේ වගාවට ප්‍රසිද්ධ දිස්ත්‍රික්ක 2 ක් පිළිවෙලින් ලියන්න. (ල. 02)

ii. තේ වගාව සඳහා අවශ්‍යකරන පහත සඳහන් භෞතික සාධක ලියන්න. (ල. 03)

a. පස b. උෂ්ණත්වය c. වර්ෂාපතනය

iii. a). ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදන අලෙවි කරන යුරෝපා සංගමයේ රටවල් දෙකක් ලියන්න.

b). වර්තමානයේ රබර් වගාව ආශ්‍රිතව පැන නැගී ඇති ගැටළු 2 ක් දක්වා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

(08) • මැකරල් • ලීක්ස් • බෝංචි • වම්බටු

i. ඉහත දැක්වෙන එළවළු වර්ග අතුරින් කඳුරට කලාපයේ වගාකරන එළවළු වර්ග දෙක තෝරා ලියන්න. (ල. 02)

ii. a). ශ්‍රී ලංකාවේ කෙසෙල් වගාව බහුලව සිදුකරන දිස්ත්‍රික්කයක් ලියන්න.

b).සත්ව පාලනයේ දී කිරිපට්ටි පාලනය පිළිබඳව රජයේ අවධානය යොමුවීමට බලපා ඇති හේතු 2 ක් ලියන්න. (ල. 03)

iii. a).ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය ආශ්‍රිත

i. පාරිසරික ගැටළුවක් හා

ii. වෙළඳාම සම්බන්ධ ගැටළුවක් ලියන්න.

b). ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කාෂිකාර්මික අංශයේ ඇති වැදගත්කම කරුණු 2 ක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 61 | S | II |
|---|---|---|---|---|

භූගෝල විද්‍යාව II - **Geography II - புவியியல்**

**Name / Index number : .........................................................**

01. (අ/A/அ)

(i) ..........................................................................................

(ii) ..........................................................................................

(iii) ..........................................................................................

(iv) ..........................................................................................

(v) ..........................................................................................


(vi) a..........................................................................................

b..........................................................................................

(vii)..........................................................................................


| Official Use Only |
|---|
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| |
| 10 |

(ආ) /(ஆ)/ (b)




| | |
|---|---|
| (i) | |
| (ii) | |
| (iii) | |
| (vi) | |
| (v) | |
| | |

(ඇ) /(இ)/ (c)




| | |
|---|---|
| (i) | |
| (ii) | |
| (iii) | |
| (vi) | |
| (v) | |
| | |

1. (අ) (அ) (a) $\overline{10}$ (ආ) (ஆ) (b) $\overline{5}$ (ඇ) (இ) (c) $\overline{5}$ = $\overline{20}$